**යටිනුවර ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

යටිනුවර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට යටිනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මිලට ගෙන තිබුණු රු.57,348 ක මේස 02 ක් රු.573,348 ක් ලෙස ගිණුම්වල දක්වා තිබීම හේතුවෙන්, ලී බඩු හා උපකරණ රු.516,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ දැන්වීම් පුවරු ආදායම රු.1,451,575 ක් වුවත්, එය රු.1,218,195 ක් ලෙස රු.233,380 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා උසාවි දඩ ආදායම උපලේඛන අනුව, රු.3,476,079 ක් වුවත්, රු.3,004,565 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, රු.471,514 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | වෙනස්කම් හඳුනා ගෙන ගිණුම් නිවැරදි කළ යුතුය |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු වරිපනම් ශේෂය වරිපනම් මෘදුකාංගය අනුව රු.4,283,054 ක් වුවත්, වරිපනම් බදු ගිණුම අනුව ලැබිය යුතු ශේෂය රු.3,754,626 ක් වූයෙන්, රු.528,428 ක නොසැඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව | නොසැඳීම්හඳුනා ගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.3,254,528 ක ණයගැති ශේෂ 52 ක් විධිමත් අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | මෙය දෝෂයක් බව පිළි ගන්නා අතර, විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කරන බව | අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.3,910,346 ක වත්කම් විෂයයන් 02 ක ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ණයගැති ශේෂ සම්බන්ධව තවදුරටත් තොරතුරු සොයා බලා සුදුසු කටයුතු සිදු කරන බව | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට ලේඛන, උපලේඛන, නිවැරදිව පවත්වා ගත යුතුය |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් පත්‍රයේ පළ කළ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත (සංශෝධන)** | | | |
| | III කොටස | පේරාදෙණිය, කොළඹ ප්‍රධාන පාර ආසන්නයේ පුද්ගලයෙකු අනුමැතියක් ලබා ගැනීමකින් තොරව මහවැලි රක්ෂිතයට හානි කරමින් ඉදිකිරීම් කරමින් පැවතුණ ද, සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | ඉඩම් හිමිකරු විසින් ඉදිකිරීම් සැලැසුම අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, ස්ථානීය පරීක්ෂාවක් සිදු කර එම ඉදිකිරීම් කටයුතු සඳහා විධිමත් අනුමැතියක් ලබා දීමට හැකි ද, යන්න තීරණය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය හා මහවැලි සංවර්ධන අධිකාරියේ මූලික සැලැසුම් තීරණයක් සඳහා යොමු කර ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | | |
| (i) | රීති 29 | ඉකුත් වර්ෂයේ ඔක්තෝබර් 04 දින සිට සමාලෝචිත වර්ෂයේ ජනවාරි 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ අවස්ථා 49 කදී, දින 01 සිට දින 62 දක්වා කාල ප්‍රමාදයකින් රු.3,681,882 ක මුදල් බැංකුගත කර තිබුණි. | පළාත් පාලන විමර්ශණ කණ්ඩායමේ ඉදිරි වාර්තා අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | රීතිවලට අනුව කටයුතු කළ යුතුය |
| (ii) | 59 | සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මේ වන විට සමීක්ෂණය සිදු කරමින් පවතින බව | සමීක්ෂණ කටයුතු සිදු කර ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අය කළ යුතුය |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | මු.රෙ.571 (3) | කාලය ඉකුත් වූ අවස්ථා 222 කට අදාළ වසර 11 ක කාලයක සිට පැවතුණ රු.7,220,171 ක තැන්පතු නිරවුල් කර නොතිබුණි. | වසර 02 ඉක්ම වූ ශේෂයන් රජයේ ආදායමට ගැනීම සඳහා අදාළ ආදායකයින්ට ලිපි යවා එම කටයුතු සිදු කරන බව | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය |
| (ඈ) | ආයතන සංග්‍රහයේ I වැනි බාණ්ඩයේ XIV වැනි පරිච්ඡේදයේ 4.1 හා 4.1.1 වගන්ති | රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණ පෞද්ගලිකව ඉටු කර ගත යුතු අවශ්‍යතාවයක් අනුව, පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතා පාඨමාලාවට සහභාගී වූ නිලධාරීන් 16 දෙනෙකුට රු.126,150 ක ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | තවදුරටත් මෙම ගෙවීම් සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බව | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය |
| (ඉ) | 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2052 දරන ගැසට් පත්‍රයේ පළ කළ දැන්වීම් පුවරු පිළිබඳ 1952 අතුරු ව්‍යවස්ථාව | සමාලෝචිත වර්ෂයේ දී දැන්වීම් පුවරු 72 කින් රු.351,080 ක ගාස්තු අය කර නොතිබුණි. | කඩිනමින් මෙම මුදල් අය කර ගැනීමටත් ඒසේ නොගෙවන්නේ නම්, දැන්වීම් පුවරු ගලවා ඉවත් කරන බව | වාර්ෂිකව සමීක්ෂණය කර ගාස්තු කාලීනව අය කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.97,582,139 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.64,033,946 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,468,000 | 3,711,599 | 4,801,001 | 3,806,125 | 3,467,800 | 3,714,234 | 3,508,330 | 4,895,528 |
| (ii) | කුලී | 1,500,000 | 1,163,355 | 548,580 | 1,400,205 | 1,300,000 | 1,051,100 | 269,170 | 785,430 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,405,000 | 4,225,144 | 4,225,144 | -- | 2,548,000 | 2,170,513 | 2,170,513 | -- |
| (iv) | වෙනත් ආදායම් | 76,500,000 | 65,629,145 | 19,232,229 | 143,886,548 | 85,350,200 | 87,245,363 | 81,142,699 | 97,489,632 |
| | එකතුව | 86,873,000 | 74,729,243 | 28,806,954 | 149,092,879 | 92,666,000 | 94,181,210 | 87,090,712 | 103,170,590 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.103,170,100 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එම වටිනාකම රු.149,092,879 ක් ලෙස හිඟ ආදායම් සියයට 48 කින් ඉහළ ගොස් තිබුණි. | හිඟය අවම කර ගැනීමට කටයුතු සිදු කරන බව | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | **වරිපනම්** | | |
| (i) | වරිපනම් ඒකක හිඟය රු.5,000 ත් රු.10,000 ත් අතර වරිපනම් දේපළ 82 කින් එකතුව රු.556,183 ක් ද, රු.10,000 ත් රු.50,000 ත් අතර වරිපනම් දේපළ 32 කින් රු.563,919 ක් ද, රු.50,000 ට වැඩි වරිපනම් දේපළ 04 කින් එකතුව රු.312,268 ක මුදලක් ද හිඟව පැවතුණි. මෙම හිඟ වරිපනම් අය කිරීමට ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගෙවීම් පැහැර ඇති පුද්ගලයින් සඳහා ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය අනුව, දේපළ තහනම් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව | හිඟ වරිපනම් බදු අය කර ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 30 දිනට වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රාජ්‍ය ආයතන 05 ක වරිපනම් ඒකක 11 කින් හිඟ හිටි වරිපනම් රු.485,250 ක් අය කර ගෙන නොතිබුණි. | කඩිනමින් එම මුදල් ද අය කර ගැනීමට අදාළ කටයුතු සිදු කරන බව | හිඟ වරිපනම් අය කර ගත යුතුය |

(ඇ) **කඩ කුලී**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩ කුලී එකතුව රු.1,400,205 ක් වූ අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර හිඟ කඩ කුලී රු.682,775 ක් හා වසර 05 ට වැඩි ලැබිය යුතු කඩ කුලී වටිනාකම රු.115,030 ක් අය කර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අය කරන බව | හිඟ කඩ කුලී කාලීනව අය කර ගත යුතුය |

(ඈ) **ත්‍රීරෝද රථ ගාස්තු**

| | | |
|---|---|---|
| 2020 ඔක්තෝබර් 09 වන දින අංක 2196/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය අවසානයේ දී, ත්‍රීරෝද රථ 297 ක් සඳහා රු.237,600 ක හිඟ ආදායමක් අය කර නොතිබුණි. | රථ වාහන නැවතුම් ස්ථානවල අයිතිය යටිනුවර ප්‍රා.ස. ට අයිති නොවන බැවින්, හිඟය අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති බව | හිඟ ත්‍රී රෝද රථ ගාස්තු අය කළ යුතුය |

(ඉ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.918,524 ක් හා මුද්දර ගාස්තු රු.142,211,178 ක් විය. | කඩිනමින් එම මුදල් ලබා ගැනීමට කටයුතු සිදු කරන බව | හිඟ ආදායම ගෙන්වා ගත යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී සභාව සතු ජල ව්‍යාපෘති සඳහා රසායනාගාර පරීක්ෂණ සිදු කර නොතිබුණු අතර, බැක්ටීරියා පරීක්ෂණය පමණක් සිදු කර තිබුණි. එකී පරීක්ෂණ වාර්තා අනුව, ජල ව්‍යාපෘති 04 ක බැක්ටීරියා ප්‍රමාණය සම්මත ප්‍රමාණයට වඩා පැවැති බැවින්, ගුණාත්මක පානීය ජලය බෙදා හැර නොතිබුණි. | මේ සම්බන්ධව වැඩි දුරටත් සොයා බලා ජල මූලාශ්‍ර වැඩි දියුණු කිරීමට හැකියාව පරීක්ෂා කර නිර්දේශ කරන බව | පිරිසිදු පානීය ජලය ලබා දීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්තිවලට අනුව, මළ ප්‍රවාහනය සහ කසළ ශෝධනය ප්‍රාදේශීය සභාව විසින් ඉටු කළ යුතු වුවත්, ගලි රථයක් සපයා ගැනීමට හා මළ පිරිපහදු ඒකකයක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | ජනතා අවශ්‍යතාවයන් මත මහා නගර සභාව හා අනෙකුත් පළාත් පාලන ආයතන සම්බන්ධ කර ගනිමින් මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරන බව | පනතින් දක්වා ඇති කාර්යයන් ඉටු කළ යුතුය |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 85 (ආ) හා (ඇ) වගන්ති ප්‍රකාරව, මහජනයා ගැවසෙන සියලු ස්ථානවල අවශ්‍ය පරිදි පොදු වැසිකිළි ඉඩ පහසුකම් සැපයීම හා නිසි තත්ත්වයෙන් පවත්වා ගෙන යා යුතු වුවත්, සභා බල ප්‍රදේශය තුළ පොදු වැසිකිළි 04 ක් පැවතියත්, ඒවා භාවිතයට ගැනීමට නොහැකි තත්ත්වයේ පැවතුණි. | ජනතා අවශ්‍යතාවයන් මත ඉදිරියේ දී මෙවැනි ඉල්ලීමක් ඉදිරිපත් වුවහොත්, මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරන බව | පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතුය |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සභාව වෙත පවරා තිබුණු පොත්තපිටිය බහු කාර්යය ගොඩනැගිල්ල ගිවිසුම්ගත වීමට කටයුතු නොකර 2021 ජූනි 25 වන දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 25 වන දින දක්වා පොත්තපිටිය පොලිස් ස්ථානය වෙත මාසිකව රු.46,200 ක මුදලකට වසර 03 කට බදු පදනම මත ලබා දී තිබුණ ද, රු.1,386,000 ක බදු මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිගින් දිගටම හිඟ අයකර ගැනීම සඳහා ලිපි යවා ඇති අතර, මේ වන විට මාස 3 හිඟ මුදල් රු.96,000 ක මුදලක් ගෙවා ඇති බව | බදු දුන් දේපළ සඳහා ගිවිසුම්ගත වී බදු මුදල් කාලීනව අය කර ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.3,919,247 ක් විය. එම ශේෂයන් වසර 05 ක් ඉක්මවා තිබුණ ද, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් පිළිබඳව අවධානය යොමු කර අය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ණයහිමි ශේෂ 02 ක එකතුව රු.83,056,441 ක් වූ අතර, ඉන් වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු රු.5,863,537 ක් සහ වසර 01 ත් 05 ත් අතර කාල පරාසයක තිබුණු රු.14,532,843 ක ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු නිවැරදිව සොයා බලා ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරන බව | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා කාබනික පොහොර අළෙවි ආදායම රු.1,000,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණ ද, වර්ෂය තුළ උපයා ගෙන ඇති අළෙවි ආදායම රු.5,275 ක් විය. | රසායනික පොහොර ආනයනය කිරීම තුළින් කාබනික පොහොර සඳහා ඇති ඉල්ලුම පහළ අගයක් ගනු ලැබීම මත අපේක්ෂා කළ පරිදි නිෂ්පාදිත කාබනික පොහොර අළෙවි කර ගැනීමේ ගැටළු පවතින බව | නිෂ්පාදනය කළ පොහොර අළෙවි කර ගැනීමට සැලසුම් සකස් කළ යුතුය |
| (ඉ) | 2005 වර්ෂයේ දී ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබුණු ලියාපදිංචි කැබ් රථය තක්සේරු කර ගිණුම්වල දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ නිවැරදි කරන බව | පරිත්‍යාග ගිණුම්ගත කළ යුතුය |

## 3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සභාව සතු රු.7,859,602 ක වාහන 06 කින් එක් වාහනයක් වසර 17 ක සිට ද, වාහන 04 ක් වසර 07 ක සිට ද, එක් වාහනයක් වසර 04 ක සිට ද නිෂ්කාර්යයව හා ඌන උපයෝජිතව පැවතුණි. | වාහනයක් ගම්පොල නගර සභාවට ලබා දීමටත්, වාහන 03 ක් වෙන්දේසි කිරීමටත්, වාහන 03 ක් අළුත්වැඩියා කිරීමටත් කටයුතු කරන බව | අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වත්කම් 04 ක් පවරා ගැනීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවට සහ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.2,719,000 ක් ගෙවා ඇතත්, එකී වත්කම්වල අයිතිය සභාව පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීම්වලට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව | වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | සභාව පරිහරණය කරන ඉඩම් කොටස් 34 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ පවත්වා මූලික කටයුතු සිදු කර ඇති බව | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේ දී, තනතුරු 09 ක පුරප්පාඩු 20 ක් හා ඒක් තනතුරක අතිරික්තතා 29 ක් පැවතුණි. | පුරප්පාඩු සඳහා සහන පදනම මත සේවකයින් බඳවා ගෙන සේවා අවශ්‍යතා ඉටු කර ගත් බවටත්, අතිරික්ත සේවකයින් සඳහා රාජකාරී පවරමින් සක්‍රීය සේවාවක් ලබා ගත් බව | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | සේවය අත හැර ගිය, විශ්‍රාම ගිය සහ මිය ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.956,934 ක වටිනාකමැති ණය ශේෂයන් වසර 01 සිට වසර 12 ක කාලයක සිට අය කර නොතිබුණි. | අය කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව | සභාවට ලැබිය යුතු සේවක ණය අය කර ගැනීමට කටයුතු කළ යුතුය |